**සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුව - ඌව පළාත**
**ප්‍රසම්පාදන දැන්වීමයි**
**සුනඛ වන්ද්‍යාකරණය කිරීම - 2026**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයන්හි ගැහැණු හා පිරිමි සුනඛයින් වන්ද්‍යාකරණය කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| අ.අ | වටිනාකම | වන්ද්‍යාකරණය කළ යුතු සුනඛයන් ප්‍රමාණය | ලංසු සුරක්ෂණය | ආපසු නොගෙවන ලංසු ආකෘතිපත්‍ර ගාස්තු | මූල්‍ය ප්‍රභවය |
|---|---|---|---|---|---|
| 01. | රු. මිලියන 03 | 905 | රු. 30,000.00 | රු. 3,500.00 | මධ්‍යම රජය (සෞඛ්‍ය අමාත්‍යාංශය) |

**01.** ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ආකෘතිපත්‍ර ගාස්තු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවීම් කර රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලංසු ලේඛන ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවෙන් නිකුත් කරනු ලැබේ.

**02.** ලංසු ආකෘතිපත්‍ර නිකුත් කරන්නේ 2026.07.09 දින සිට **2026.07.22** දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. **09.00** සිට ප.ව. **03.00** දක්වා පමණි.

**03.** ලංසු සුරක්ෂණ ගාස්තු මුදලින් ගෙවන්නේනම් ඉහත වටිනාකමට අදාළ මුදල, ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ඇති, බදුල්ල මහජන බැංකු මුතියංගණ ශාඛාවේ ගිණුමේ අංක **269 - 100188440649** දරණ ජංගම ගිණුමට තැන්පත් කර, ඊට අදාල ලදුපත ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයට ඉදිරිපත් කර, නියමිත කුවිතාන්සි පතක් ලබා ගෙන එය ලංසු සුරක්ෂණය ලෙස ඉදිරිපත් කල යුතුය.

**04.** ලංසු සුරක්ෂණ ගාස්තු සඳහා බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් ඉහත වටිනාකම සඳහා පිළිගත හැකි වාණිජ බැංකුවකින් ලබාගත්, ඉල්ලූ විට ගෙවනු ලබන, කොන්දේසි විරහිත (On demand, Unconditional), **2026.10.28** දින දක්වා වලංගු වන සේ, බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. (ආදර්ශ ආකෘති පත්‍රය ලංසු ලේඛනය සමග අමුණා ඇත.)

- පශු වෛද්‍ය වරුන්ගේ සංගමයේ ලියාපදිංචිය හා වසර දෙකක සේවා පල පුරුද්දක් ඇති ආයතන හෝ පුද්ගලයින් සඳහා ඉල්ලුම් කිරීමට හැකිය.

- පිටපත් **02** කින් යුතුව නිකුත් කරනු ලබන ලංසු ආකෘතිපත්‍ර නිසි අයුරින් එකම ආකාරයකට සම්පූර්ණ කර තිබිය යුතුවේ. ලංසු ආකෘති පත්‍ර යුගලය එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා මෙම කවර දෙක එක් කවරයක බහා කවරයේ වම් පස ඉහල කෙලවරේ **"සුනඛයින් වන්ද්‍යාකරණය කිරීම (බදුල්ල දිස්ත්‍රික්කය) - 2026"** යනුවෙන් සඳහන් කර , ඊට පහලින් අයදුම්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුවේ.

- මුද්‍රා තබන ලද ලංසු **2026.07.23** දින ප.ව. **2.30** ට පෙර ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටිය බහාලිය යුතුවේ. නැතහොත් එකී වේලාවට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, අංක **301**,ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ අයදුම් පත්‍ර හා නියමිත දින නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- පූර්ව ලංසු සාකච්ඡාව **2026.07.16** දින පෙ.ව. **10.00**ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත් වේ. ලැබී ඇති සියලුම ලංසු **2026.07.23** දින ප.ව. **3.00** ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී, ලංසු විවෘත කිරීමේ මණ්ඩලය ඉදිරිපිටදී විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු පත් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහු /ඇය විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයකු සහභාගි කරවිය හැකි අතර ඔහු තම අනන්‍යතාවය තහවුරු කිරීමට සමත් විය යුතුය.

- සතියේ වැඩ කරන දින, කාර්යාල වේලාව තුල ලංසු ආකෘති පත්‍ර නොමිලේ පරීක්ෂා කල හැකි අතර, ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය.
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
3 වන මහල , අංක 301,ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල. විද්‍යුත් ලිපිනය - pdhsuvaacc@gmail.com දුරකථන අංක :- 055-2231981
ෆැක්ස් අංක :- 055-2223098